www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඩිමොක්‍රැටික් අපේක්ෂක කෙරී එක්සත් ජනපද හමුදා වසර ගනනාවක් ඉරාකයේ රඳවා තබන බවට සහතික වෙයි

## Democratic candidate Kerry vows to maintain US troops in Iraq for years

**පැට්‍රික් මාටින් විසිනි**
**2004 ජුලි 17**

තමන් පත් වුව හොත් තම නිල කාලය අවසන් වන 2008 වසර අවසානය තෙක් එක්සත් ජනපද හමුදා ඉරාකයේ රැඳී සිටිනු ඇතැයි බ්‍රහස්පතින්දා *වෝල් ස්ට්‍රීට් ජර්නලය* සමග පැවති සම්මුඛ සාකච්ඡාවක දී ඩිමොක්‍රැටික් ජනාධිපති අපේක්ෂක ජෝන් කෙරී ප්‍රකාශ කලේ ය. බුෂ් පරිපාලනය යටතේ කෙරී පරිපාලනයකට වඩා ඉක්මනින් හමුදා ආපසු කැඳවෙනු හැකි බව ද ඔහු ඇඟවුම් කලේ ය.

සම්මුඛ සාකච්ඡාවේ අන්තර්ගතය හා එය පල කිරීම සඳහා තෝරා ගැනීම යන දෙක ම -- ඉරාක යුද්ධයේ වඩාත් ම උද්වේගකර මාධ්‍ය උපදේශකයා මෙම පුවත්පත වන අතර එය ඇමරිකානු දේශපාලන සංස්ථාපිතයේ අන්ත දක්ෂිනාංශයෙහි ප්‍රමුඛ කර්තෘ ප්‍රකාශනවලින් එකකි -- පනිවුඩයක් දීම සඳහා දේශපාලනිකව මනාව ගනන් බැලූ ඒවා ය. දැනට බුෂ්ගේ පසුපස වැටී සිටින අන්ත දක්ෂිනාංශික කොටස් ද ඇතුලු ඇමරිකානු පාලක ප්‍රභූවට කෙරී යලි සහතික කරන්නේ ඉරාකයේ එක්සත් ජනපද මිලිටරි ග්‍රහනය අඛන්ඩව පවත්වා ගෙන යාම සඳහා තමන් මත විශ්වාසය තැබිය හැකි බව යි.

ඉරාකයෙන් ඇමරිකානු හමුදා ඉවත් කර ගැනීම සඳහා සපුරා ලිය යුතු කොන්දේසි තුනක් කෙරී ඉදිරිපත් කලේ ය. රටෙහි ''ස්ථාවරත්වයේ මට්ටම මැන බැලීම,'' ''ස්ථාවරත්වය පවත්වා ගැනීම සඳහා ඇති බලාපොරොත්තු මතය විමසා බැලීම'' හා රට රැක ගැනීමෙහි ලා ''ඔවුන්ගේ ආරක්ෂක හමුදාවලට ... ඇති හැකියාව මැන බැලීම'' අවශ්‍ය බව ඔහු කීවේ ය. එතෙක් ''ඉරාකය තුල අසාර්ථක රාජ්‍යයක් ලෝකයට අවශ්‍ය නැති බව මම සිතමි'' යි ඔහු වැඩි දුරට පැවසී ය.

ඉරාකය පිලිබඳ කෙරී හා බුෂ් අතර ප්‍රධාන වෙනස බවට පත්ව ඇත්තේ බුෂ්ගේ නරුම හා ව්‍යාජ කියාපෑම්වන ඉරාකයේ එක්සත් ජනපද දූත මෙහෙවර එරටට ''නිදහස'' හා ''ප්‍රජාතන්ත්‍රවාදය'' ගෙන ඒමට යැයි බුෂ් නරුම හා ව්‍යාජ ලෙස පුනරුච්චාරනය කරන වචන *වෝල් ස්ට්‍රීට් ජර්නලය* සමග කෙරී කල සාකච්ඡාව තුල අඩංගු වී නො තිබීම යි.

ඉරාකය තුල සාර්ථකත්වය සඳහා කෙරී ගෙන හැර දැක් වූ මිනුම්දඬු තුන ම හිටපු ජනාධිපති සදාම් හුසේන් තන්ත්‍රයේ ස්වභාවය විස්තර කරනු ඇත්තේ ය යන කාරනය සැලකිල්ලට ගැනීම අගනේ ය. මිනුම්දඬු තුන ම -- ස්ථාවරත්වය, කල් පවත්නා ස්ථාවරත්වය හා ආරක්ෂාව -- එක්සත් ජනපද පිටුබලය ලබන වත්මන් ඉරාක අගමැති අයාද් අලාවි වැනි නව සදාම් කෙනෙකු ගෙන යන මිලිටරි - පොලිස් ආඥාදායකත්වයක් ඇටවීම මගින් සපුරා ගනු ඇත්තේ ය.

කෙරී නියෝජනය කරන්නේ ප්‍රජාතාන්ත්‍රීයකරනය පිලිබඳ බුෂ්ගේ දෙබිඩි කතා පසෙක තැබීමේ උවමනාවෙන් පෙලෙන එක්සත් ජනපද පාලන තන්ත්‍රයේ කොටස යි. යුද්ධය සඳහා සූදානම් වන කාලයේ දී ඇමරිකානු ජනතාව රැවටීම සඳහා මෙය අවශ්‍ය වුව ද දැන් ඇමරිකානු ප්‍රාග්ධනයට ඉරාකයේ විශාල තෙල් නිධිවලින් හා බැග්ඩෑඩයේ එක්සත් ජනපද රූකඩ තන්ත්‍රය සමග එක්ව වාසිදායක කොන්ත්‍රාත්වලින් ලාභ ගසා කෑම සඳහා සුදුසු ආරක්ෂක පසුබිමක් ගොඩ නගමින් ඔවුන්ගේ සැබෑ ජාවාරමට එලඹීමේ කාලය පැමින තිබෙන්නේ යැයි ඔවුහු ඒත්තු ගනිති.

*ජර්නලය* සාකච්ඡාව කැටි කර දැක්වූ ආකාරයට, ''ඉරාකය තුල දී ද වඩා පුලුල් ත්‍රස්ත විරෝධී යුද්ධයෙහි දී ද සාර්ථකත්වය වෙනුවෙන් බුෂ් මහතා ගොඩ නගා ඇති එම අරමුන ම වඩාත් ඵලදායී ලෙස අනුගමනය කරන ශක්තිමත් නායකයෙකු ලෙස තමන් ඉදිරිපත් කිරීමට කෙරී මහතා අධිෂ්ඨානශීලීව සිටියි.''

බුෂ් පිලිබඳ කෙරීගේ විවේචන වේ නම් ඒවායින් බොහොමයක් දකුනෙන් කරන ඒවා ය. ජනාධිපති ලෙස තමන් ''මෙම ජනාධිපතිට හා ඔහුගේ ආරක්ෂක ලේකම්ට වඩා ගෞරවාන්විතව ඔවුන්ට ඇහුම්කන් දෙන බව'' කියා සිටි ඔහු බුෂ් ප්‍රමානවත් ලෙස මිලිටරි නායකයන් විමසා බලා නැති බව සඳහන් කලේ ය. එක්සත් ජනපද සන්ධානයන්ට සිදු කර ඇති හානිය පිලිසකර කිරීම සඳහා නව ජනාධිපතිවරයෙකු අවශ්‍ය බව කියමින් මිලිටරි ග්‍රහනය පවත්වා ගෙන යාමට අනෙකුත් රටවල හමුදා දායකත්වය ලබා ගැනීමේ දී වැඩි සාර්ථකත්වයක් අත් කර ගන්නා බවට ද ඔහු පොරොන්දු විය.

එක්සත් ජනපද පිටුබලය ලබන නව පාලන තන්ත්‍රය අනතුරේ හෙලමින් ඉක්මනින් හමුදාව ආපසු කැඳවීමට බුෂ් උත්සාහ දැරිය හැකි යයි කෙරී අනතුරු හැඟවී ය. යුද්ධය කෙරෙහි වැඩෙන මහජන විරුද්ධත්වය සමහන් කිරීම සඳහා ධවල මන්දිරය නොවැම්බර් මැතිවරනවලට කලින් හමුදාවන්ගෙන් කොටසක් ආපසු කැඳවිය හැකි බව ''බොහෝ දෙනා කියනු මට ඇසී තිබෙනවා'' යැයි ඔහු *ජර්නලයට* කී ය. ''ඕනෑ ම දේශපාලන වෙනසකට මම සූදානම්. මම ඒ කිසිවක් අතීතයට නො දමමි'' යි කෙරී කීවේ ය.

ඉරාකය තුල එක්සත් ජනපද රැඳී සිටීම ''අසීමිත කාලයකට කැප වීමක්'' නො වූ බව කෙරී ප්‍රකාශ කල ද මිලිටරි ග්‍රහනය අවසන් කරන දිනයක් සඳහන් කිරීම ඔහු ප්‍රතික්ෂේප කලේ ය. ''මගේ ප්‍රථම නිල කාලය අවසන් වන විට සංඛ්‍යාව සැලකිය යුතු තරමින් අඩු කර නො ගත හොත් එය මගේ රාජ්‍ය තාන්ත්‍රික දුබලතාවක් ලෙස මම සලකන්නෙමි'' යි ඔහු පුවත්පතට ප්‍රකාශ කලේ ය. එහෙත් ''ඔබට නිශ්චිත සංඛ්‍යාවන් ගැන සඳහන් කිරීමට මට නුපුලුවන.''

## යුද විරෝධී මතය බැහැර කරයි

කෙරීගේ ප්‍රකාශනයන් සැලකිය යුතු හා උපදේශාත්මක දේශපාලනික සංසිද්ධියක වඩා දීප්තිමත් ගෙන හැර පෑමක් පමනකි. දැන් බොහෝ ඇමරිකානුවන් එක්සත් ජනපදයේ ඉරාක ආක්‍රමනය ප්‍රමාද දෝෂයක් ලෙස සැලකුව ද සියයට හතලිහකට වැඩි දෙනෙකු ඇමරිකානු හමුදා ආපසු කැඳවිය යුතු යැයි විශ්වාස කල ද නිල ද්වි-පක්ෂ ක්‍රමය යුද විරෝධී මහජන මතයට අවකාශයක් නොමැති ජනාධිපතිවරන ව්‍යාපාරයක් නිර්මානය කිරීමේ කුමන්ත්‍රනයක නිරතව සිටියි.

බුෂ් යලි පත් කර ගැනීමේ රිපබ්ලිකන් උද්ඝෝෂනය යුද්ධයට පූර්න සහයෝගය දීම, ත්‍රස්තවාදයට සදාම් හුසේන්ගේ සම්බන්ධකම් පිලිබඳ එක දිගට ම හෙලිදරව් වී ඇති බොරු නො නවත්වා පුනර්කරනය කිරීම හා මිලිටරි ආක්‍රමනය සහ පූර්ව-භංග යුද්ධයක් පිලිබඳ බුෂ්ගේ ප්‍රතිපත්තිය ඇමරිකානු ජනතාව වඩා සුරක්ෂිත කර ඇත යන කියා පෑම් මත සැබවින් ම පාදක වී තිරේ.

කෙරී පත් කර ගැනීමේ ඩිමොක්‍රැටික් උද්ඝෝෂනය බුෂ්ගේ ඉරාක යුද්ධ කලමනාකරනය විවේචනය කරන නමුත් -- ඉරාකයට පහර දීමට බුෂ්ට බලය පැවරීම සඳහා 2002 ඔක්තෝබරයේ පැවති එක්සත් ජනපද සෙනේට් සභා ඡන්දයේ දී කෙරී මත් සහයෝගය දුන් -- යුද්ධයේ මූලික පදනම් කිසිවකට හෝ අභියෝග නො කරයි.

*ලෝසවෙඅ* කලින් විස්තර කර ඇති පරිදි (බලන්න, ''හොවාඩ් ඩීන්ගේ නැගීම හා බැසීම: ඩිමොක්‍රැටික් පක්ෂ දේශපාලනය පිලිබඳ බලගතු පාඩමක්'') ජනාධිපති උද්ඝෝෂනයේ කේන්ද්‍රීය කරුන බවට යුද්ධය පත් වීම වැලැක්වීම සඳහා පක්ෂ නායකත්වය හා සංගත-පාලිත මාධ්‍ය විසින් ඩිමොක්‍රැටික් නාම යෝජනා තරගය පරෙස්සමෙන් හසුරුවනු ලැබී ය. පසු ගිය වසරේ ඉදිරි අපේක්ෂකයාගේ තැනට හිටපු වර්මොන්ට් ආන්ඩුකාර හොවාඩ් ඩීන් නැගී ඒමට යුද විරෝධී මනෝගතිය හේතු විය. කෙරී හා ඔහුගේ උපජනාධිපති අපේක්ෂක ජෝන් එඩ්වර්ඩ්ස් ද ඇතුලත් ඩීන්ගේ ප්‍රතිවාදීහු බොහෝ දෙනා ජනාධිපති අපේක්ෂකත්වය සාර්ථක ලෙස ඔහුගෙන් උදුරා ගැනීම සඳහා ඩිමොක්‍රැටික් ප්‍රාථමික ඡන්ද දායකයන්ගේ යුද විරෝධී මතවාදයට අනුගත වූහ.

ප්‍රතිඵලය වන්නේ ඩිමොක්‍රැටික් ඡන්ද දායකයන්ගෙන් අතිමහත් බහුතරය යුද්ධයට විරුද්ධ හා හැකි ඉක්මනින් ඇමරිකානු හමුදා ආපසු කැඳවීමට පක්ෂපාතී වුව ද ඩිමොක්‍රැටික් පක්ෂ වේදිකාව හා එහි අපේක්ෂකයා ඇමරිකානු අධිරාජ්‍යවාදයට මැද පෙරදිග තුල අධිපති මූලෝපායික තත්වයක් ලබා දෙන හා එක්සත් ජනපද සංගතයන්ගේ අවශ්‍යතාවන් සඳහා ලොව දෙවන විශාලතම තෙල් නිධි සුරක්ෂිත කර දෙන ස්ථාවර එක්සත් ජනපද ගැති තන්ත්‍රයක් යන අපේක්ෂිත ඵලය අත් කර ගැනීම සඳහා අවශ්‍ය තරම් කාලයක් එමරිකානු හමුදා ඉරාකය තුල රැඳවීමට කැප වී සිටීම යි.

ඩිමොක්‍රැටික් පක්ෂයේ මැතිවරන ප්‍රකාශනය කෙටුම්පත් කිරීමේ දී යුද විරෝධී මතවාදයන් බැහැර කොට ඇත. පිටු 35කින් යුත් මැතිවරන ප්‍රකාශනයට වචන 16,000ක් අඩංගු වුව ද එය ඇමරිකානු ජනතාව මුහුන දෙන කේන්ද්‍රීය දේශපාලන ප්‍රස්තුතය පිලිබඳ ආස්ථානයක් නො දරයි. ඉරාක යුද්ධය පිලිබඳ කෙටුම්පත් භාෂාව ප්‍රකාශ කරන්නේ ''හිත හොඳ මිනිසුන් ඇමරිකාව ඉරාක යුද්ධයට එලඹීම පිලිබඳව නො එකඟ වෙති'' යනුවෙනි. එක්සත් ජාතීන් සහභාගි කර ගැනීම, වැඩි ජාත්‍යන්තර සහයෝගයක් ලබා ගැනීම ආදී දැන් කල යුතු දේ සම්බන්ධයෙන් ප්‍රකාශනය තුල බොහෝ සාකච්ඡාවන් සිදු වේ. එහෙත් යුද්ධය සාධාරන ද නැද්ද යන්න පිලිබඳව ප්‍රකාශනය සරලව ම මුනිවත රකියි.

ඒ වෙනුවට පලස්තීන ජනතාවට එරෙහි ඊස්රායල යුද්ධයට එක්සත් ජනපද සහයෝගය ඇඩි කරමින් හා ඉරාක මිලිටරි ග්‍රහනය අඩු හෝ වැඩි වසයෙන් දිගට ම පවත්වා ගෙන යමින් එක්සත් ජනපද මිලිටරියේ ප්‍රමානය 40,000කින් වැඩි කිරීමට ඩිමොක්‍රැටිකයෝ යෝජනා කරති. ''නො වැලැක්විය හැකි ලෙසට ත්‍රස්තවාදීන්ගේ පරාදීසයක් බවට පත් වන හා මැද පෙරදිග අස්ථාවර කරන බලවේගයක් බවට පත් වන අසාර්ථක රාජ්‍යයක් ඉරාකය තුල බිහි වීමට අපට ඉඩ දිය නො හැකි ය'' යි ප්‍රකාශන කෙටුම්පත වාර්තා කරයි.

යුද්ධය ප්‍රමාද දෝෂයක් බව ප්‍රකාශ කරන හා ඇමරිකානු හමුදා ආපසු කැඳවීමට නිශ්චිත දිනයක් දීම යෝජනා කරන භාෂාව ප්‍රකාශන කමිටුව ප්‍රතික්ෂේප

කලහ. ජනාධිපති අපේක්ෂකයා තේරීමේ ප්‍රාථමික ඡන්දවල දී සාම අපේක්ෂකයෙකු ලෙස තරග කල කොන්ග්‍රස් සභික ඩෙනිස් කුසිනික්ගේ ආධාරකරුවෝ ප්‍රකාශනය තුල යුද විරෝධී භාෂා ශෛලිය සඳහා ඔවුන්ගේ ඉල්ලීම අත් හරිමින් සම්මේලනයේ දී එම කාරනය පිලිබඳව බලපෑම් නො කිරීමට එකඟ වූහ. ප්‍රකාශන සාකච්ඡාවේ කුසිනික්ගේ නියෝජිත හවායිහි ඇනා ඩයස් ''අපට අවශ්‍ය වන්නේ එක්සත් වීමට බව'' පවසමින් සටන අත හැර දැමීමට කුසිනික් තමන්ට උපදෙස් දී ඇති බව හෙලි කලා ය.

පසු ගිය සතියේ පුවත්පත් කිහිපයක් හා ''මිනිත්තු 60'' නම් සීබීඑස් ප්‍රවෘත්ති වැඩ සටහන සමග පැවති එක්සත් සම්මුඛ සාකච්ඡාවල දී කෙරී සහ ඔහුගේ දෙවෙනියා වන එඩ්වර්ඩ්ස් ඉරාකය ආක්‍රමනය කිරීමේ තීන්දුව පිලිබඳව එවැනි ම දෙපිටකාට්ටු ආස්ථානයක් ගත්හ.

ඉරාකය සමග යුද්ධය සඳහා බුෂ් පරිපාලනයට පදනම සැකසූ ජන සංහාරක අවි රැස් කිරීම හා ත්‍රස්තවාදීන් සමග සබඳතා පැවැත්වීම යන කරුනු බොරු බවට සෙනේට් සභා රහස් තොරතුරු කමිටු වාර්තාවක් පල වී ඇති තතු තුල යුද්ධයට බලය පවරමින් තමන් දුන් ඡන්දය පිලිබඳව පසුතැවෙන්නේ දැයි දෙදෙනාගෙන්  ම අසනු ලැබී ය.

දැන් ඔවුන් සතු අවබෝධයෙන් යුතුව ඩිමොක්‍රැටිකයෝ තමන් යුද්ධය සඳහා ඡන්දය පාවිච්චි කලේ දැයි යන්නට ඍජු පිලිතුරක් දීම ප්‍රතික්ෂේප කලහ. ''ඒ හෝ මේ තොරතුරු තිබුනේ ය යන්න මත සෛද්ධාන්තිකව පිහිටා අප කල යුතුව තිබුනේ කුමක් දැයි යලි අගැයීම කරා ආපසු යාමට උත්සාහ කිරීම දැන් අපට ප්‍රයෝජනවත් නො වේ'' යැයි ප්‍රකාශ කරමින් එඩ්වර්ඩ්ස් තම ආස්ථානය කැටි කොට දැක්වී ය.

''බලන්න, ඡන්දය අද නො වේ, එය එපමන යි. සෙනේට් සභික එඩ්වර්ඩ්ස් සමග මම සම්පූර්නයෙන් එකඟ වෙනවා. එය (ඡන්දය ගැන කතා කිරීම) කාලය නාස්ති කිරීමක්. එය මේ කුමක් ගැන දැයි යන්න නො වේ. එම මොහොතෙහි අප ඉදිරියේ තිබූ තොරතුරු මත පදනම්ව අපි ඡන්දය දුන්න විදිහට දුන්නා. එම කාල සීමාවේ දී පැවති තොරතුරු මත පදනම් වන විට එය නිවැරදි ඡන්දයක්''යැයි මග හැරීමට අහංකාරකම ද එකතු කරමින් කෙරී *නිව් යෝක් ටයිම්ස්* පුවත්පතට පැවසී ය.

**සසප විකල්පය**

කෙරී විවෘතව යුද්ධය වැලඳ ගැනීම පෙන්නුම් කරන්නේ *නේෂන්* සඟරාව ද චිත්‍රපට අධ්‍යක්ෂ මයිකල් මුවර් සහ මහාචාර්ය නෝම් චොම්ස්කි ද ඇතුලත් බොහෝ ප්‍රමුඛ ලිබරල් යුද විරෝධීන් අනුගත වූ ආස්ථානයේ දේශපාලනික බංකොලොත් භාවය යි. ඉරාකයේ විශ්වාස කටයුතු රූකඩ පාලන තන්ත්‍රයක් අටවන තෙක් එහි ආක්‍රමනික ග්‍රහනය එක්සත් ජනපදය දිගට ම පවත්වා ගත යුතු බවට කෙරී පුනරුච්චාරනය කරන හා සුපැහැදිලි ප්‍රකාශයන් මධ්‍යයේ වුව ද යුද විරෝධී මහජන මතය ප්‍රකාශ කිරීම සඳහා වාහකයක් ලෙස ඔවුහු කෙරී ඉදිරිපත් කරති.

මෙම ලිබරලුන් කෙරීට දිගට ම සහයෝගය දෙන්නේ ඔහු බුෂ් යලි බලයට පත් වීමට ඇති එක ම ශක්‍ය විකල්පය වේ ය යන පදනමෙනි. නොවැම්බර් 2 දා බුෂ් හෝ කෙරී හැර අනෙකෙකු තේරී පත් නො වන බව සැබවින් ම සත්‍යයකි. එහෙත් එය කෙරීට සහයෝගය දැක්වීම හෝ ඡන්දය දීම සඳහා තර්කයක් නො වේ. එය ඇමරිකානු ජනතාවට එවැනි සිර කරන ලද ප්‍රතිගාමී විකල්පයන් ඉදිරිපත් කරන්නා වූ එක්සත් ජනපද ද්වි-පක්ෂ ක්‍රමය ප්‍රතික්ෂේප කිරීමට තර්කයකි.

මැතිවරනයේ කේන්ද්‍රීය කාරනය වන්නේ යුද විරෝධී ඡන්ද දායකයන්ගේ පමනක් නො ව  ඇමරිකානු ජනතාවගේ අතිබහුතරය වන සමස්ත කම්කරු පන්තියේ දේශපාලන මතවාදයට ඇබය ගැසීම යි. බුෂ්, චෙනී, කෙරී හා එඩ්වර්ඩ්ස් යන සියලු ම දෙනා මහා ව්‍යාපාරිකයන්ගේ පක්ෂ දෙක පාලනය කරන සහ ඇමරිකානු දේශපාලන ජීවිතයේ ඒකාධිකාරය දරන දසලක්ෂපතියන්ගේ හා සංගත ප්‍රධානයන්ගේ පටු තීරුවක් මත රඳා සිටිනා හා එමගින් හැසිරවෙන දස ලක්ෂපති දේශපාලනඥයෝ යි.

ද්වි-පක්ෂ ක්‍රමයට විකල්පයක් වර්ධනය කල හැක්කේ කම්කරු පන්තියේ ස්වාධීන දේශපාලනික බලමුලු ගැන්වීමක් හා සමාජවාදී ක්‍රියා මාර්ගයක් මත පදනම් වූ නව මහජන දේශපාලන පක්ෂයක් ගොඩ නැංවීම මගින් පමනි.

2004 වසරේ සමාජවාදී සමානතා පක්ෂ මැතිවරන ව්‍යාපාරය -- ජනාධිපති හා උපජනාධිපති අපේක්ෂකයන් ලෙස බිල් වැන් ඕකන් හා ජිම් ලෝරන්ස් සහ කොන්ග්‍රසයේ හා ව්‍යවස්ථාදායකයේ අපේක්ෂකයන් -- මෙම ඓතිහාසික හා හදිසි කර්තව්‍යය සපුරා ලීමේ අරගලය පෙරට ගෙන යෑමේ මාධ්‍යයන් සම්පාදනය කරයි.

© www.wsws.org